## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

SDFL
The Nation's Leader in Skills Development

# ශ්‍රී/ස නිපුණතා සංවර්ධන අරමුදල

# තනතුරු පුරප්පාඩු

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සේවා ගණය : ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1) තනතුර : සාමාන්‍යාධිකාරී තනතුරු සංඛ්‍යාව : 01**

බාහිර අයදුම්කරුවන්

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ විද්‍යාව / ආර්ථික විද්‍යාව / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය උපාධියක් සමග පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

**(ආ) පළපුරුද්ද**

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

"කළමනාකරණ" සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි අවම වශයෙන් වසර 5 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | |
|---|---|
| ● **වැටුප් කේතය හා වැටුප් පරිමාණය :** HM 1-1-2025-Rs. 140,640 - 15 X 4,100 - 202,140 (වැටුප් ගෙවනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛනය II ට අනුව බව සලකන්න) | ● **වයස් සීමාව :** අවුරුදු 40 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |

**වෙනත් :**

**සෑම ඉල්ලුම්කරුවෙක්ම :**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

IV. මෙම තනතුර ස්ථිර තනතුරු වන අතර සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.

V. ඉහත වැටුප් වලට අමතරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) විසින් අනුමත ජීවන වියදම් දීමනාව සහ විශේෂ දීමනා ගෙවනු ලැබේ.

VI. රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් එම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.

VII. සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් පත්වීම් බලධරයා විසින් ගනු ලබන තීරණ අනුව සිදු කරනු ලබයි.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතිකවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව සකස් කළ අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2025 ඔක්තෝබර් මස 21 දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්වියයුතුය. තැපෑලේදී අස්ථානගතවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ශ්‍රී/ස නිපුණතා සංවර්ධන අරමුදල වග කියනු නොලැබේ. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබේ.

**සභාපති,**
**ශ්‍රී/ස නිපුණතා සංවර්ධන අරමුදල,**
**"නිපුණතා පියස", 7 වන මහල,**
**අංක 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.**
**දුරකථන අංක : 0112507274**